ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1641/50 - 2010 පෙබරවාරි 19 වැනි සිකුරාදා - 2010.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ (1) (අ) වැනි වගන්තිය යටතේ දැන්වීම**

අලව්ව ප්‍රාදේශීය සභාව

අලව්ව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන එච්. එම්. ධර්මරත්න හේරත් මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව අලව්ව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි ආර්. එම්. ඒ. එල්. රත්නායක වන මම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10අ(1) (අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
තේරීම් භාර නිලධාරී,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2010 පෙබරවාරි මස 11 වැනි දින
කුරුණෑගල, මැතිවරණ කාර්යාලයේ දී ය.

03-209/1

---

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ (1) (අ) වැනි වගන්තිය යටතේ දැන්වීම**

අලව්ව ප්‍රාදේශීය සභාව

අලව්ව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන කේ. ඒ. සුමතිපාල මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව අලව්ව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි ආර්. එම්. ඒ. එල්. රත්නායක වන මම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10අ(1) (අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
තේරීම් භාර නිලධාරී,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2010 පෙබරවාරි මස 11 වැනි දින
කුරුණෑගල, මැතිවරණ කාර්යාලයේ දී ය.

03-209/2

1A - G 12482 — 360 (2010/02)

## (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

දකුණු පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන වැලිගම ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

හේවා වෙල්ලාලගේ ගයාන් සංජීව නම් වූ සභිකයා අයත්වන එක්සත් ජාතික පක්ෂය නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන ජයසේකර විතානගේ ටියුඩර් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

වැලිගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කන්දඋඩ ආරච්චිගේ සුනෙත් ලෝචන වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ජයසේකර විතානගේ ටියුඩර් මහතා වැලිගම ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සී. ඒ. සුනෙත් ලෝචන,
තේරීම්භාර නිලධාරි,
වැලිගම ප්‍රාදේශීය සභාව.

2010 පෙබරවාරි මස 12 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මාතර.

03-210

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.